


# කල් - මුදල්

"තවත් දවසක් !" පින්සල ඇඟ මැළි කැඩුවා.

"තවත් මාසයක් !!" පැන්සල ඈනුමක් ඇරියා.

"තවත් අවුරුද්දක් !!!" පන්හිඳ ඇඳේ වාඩිවුණා.

"2018 ත් ලැබුවා එහෙනං......" පින් දුන්නක් දිග ඇරියා වගේ ඇඳෙන් පැන්නා.




"කාලය යයි පියඹා......." පැන් සිංදුවක තාලයට කියන ගමන් පරණ කැලැන්ඩරේ අයින් කරලා අළුත් එකක් බිත්තියේ එල්ලුවා.

"අපි වයසට යනවා......" පන් අර සිංදුවට තව පදයක් තාලෙට එකතු කළා.

"වයින් තියෙනකල්, බැටරි මාරු කරනකල් කරගන්නත් වෙනවා. ඔරලෝසුවක වයින් නැතිවා වගේ අපේ ශරීර කූඩුවටත් විඩාව දැනෙනවා. ඉතින් විවේකයක් ගන්න වෙලාවකුත් එපායැ. ?" පින් කතාවට එක්-වන්නේ එහෙම.

ඔරලෝසුවක් වගේ රැයක්, දවාලක් නැතිව දුවන්න දඟලන අයත් නැත්තේ නැහැ. ඒත් ඔරලෝසුවනම් දුවනවා." ඒ පැන්.

"ඔරලෝසු කටුවලට හැම තත්පරයක්ම එකවගෙයි. අපි තමා කාලයට අර්ථකථන දීගෙන වෙන් කරගෙන ඉන්නේ." පන් හිතට ආව දෙයක් ඕනාවට එපාවට වගේ කිව්වා.

"එහෙමම කියන්නත් බෑ. රැයක්, දවාලක් කියලා පැහැදිලි වෙනසක් ස්වභාවයෙන්ම දීලා තියෙනකොට කාලය ඒ විදියට වෙන් දන්නෙම නෑ තමන් දුවන්නේ එක වටයක. කාලය යනවා. වයසට යනවා. ඒත් අපි දුවන්නේ එකම වටයක නෙවෙයිද ?. දුන්නත් කැඩිලා හරි බැටරි දාන්න කෙනෙක් නැතිවුන දවසට හරි එක තැන් වෙනවා. එදාට කාටවත් අපෙන් වැඩක් නෑ. ඒ වෙනුවට අළුත්ම ඩිජිටල්, සෝලා පවර් කට්ටිය ආදේශ වෙනවා. ඕක තමයි මේකේ හැටි...... !

"උදේම එක අංකයකට ඇහැරෙනවා. කාලා බීලා ලක ලෑස්ති වෙලා තවත් අංකයකට වැඩට යන්න පිටත් වෙනවා. වැඩපොළේදීත් එහෙමයි. ඒ ඒ අංකවල වෙලාවට වැඩ කරලා තවත් අංකයකට ගෙදර එනවා. රෑට නිදිමත එන්නෙත් අංකයකට. මේ අංක අපිට පෙනෙන්නේ ඔරලෝසුව."

"අංකවලට වෙලාවට වැඩ කරන එකත් වටිනවනේ." පන්ගේ කතාවට පැන් අලගු තිව්වා.

"අංකවලට දුවන්නේ නිකන් නෙවෙයිනේ. රුපියල් ඩොලර් අංක එකතු කරගන්නනේ......." පින් තවත් පැත්තකට කතාව හැරෙව්වා ඒ ගමන."

"රුපියල්, ඩොලර් අංක නැතිව බෑනේ ජීවිතයට. කොහොමද බඩ කට පුරවා ගන්නේ ? යන්නේ - එන්නේ ? අඳින්නේ - පළඳින්නේ ? හුස්ම ගන්න විතරයි ඒ අංක නැතිව පුළුවන් වෙලා තියෙන්නේ."

"අපේ ජීවිත පාලනය කරන්නෙ කාලයයි, මුදලුයි. ලස්සන වැඩේ කියන්නේ කාලය කියන එක මුදලටවත් ගන්න බෑ. ඒත් කාලය තියෙනවනම් මුදල් හොයන්න බැරි නෑ හොඳින් හරි, නරකින් හරි."

"එහෙම බලං යනකොට කාලය තමයි අපට වැඩියෙන්ම වටින්නේ. එහෙමද ?"

"කාලයත් එක්කයි අපි වයසට යන්නේ ඒ ඒ කාලයෙදී කරන්න ඕන දේ නොකළොත් අපි පරාදයි. ඒකනේ බුදුරජාණන් වහන්සේත් " අප්පමාදෝ අමතපදං" කියලා දේශනා කළේ. අප්‍රමාදය කනස්සල්ලට කාරණයක්."

"කරන්න ඕන දේ කරගන්නත් මුදල් එපාය ?" පින්ගේ ඇහි බැම නලලට ගියා.

"ඒක තමයි කියන්නේ ඒ ඒ කාලයට කරන්න ඕන දේ කරන්න ඕන කියලා. තමන්ට පුළුවන් කාලෙදි පුළුවන් හැටියෙන් හම්බ කරගන්නත් ඕන. නැත්තං ජීවත් වෙන්න හම්බ වෙන්නෙත් නෑනේ."

"ඒත් ඉතිං සාධාරණ විදියට. අනුන්ට කරදරයක් නොකර තමන්ට ප්‍රමාණවත් විදියට හම්බ කරගන්න එක තමයි වටින්නේ, අනුන්ව හූරන් කන්නේ නැතිව."

"ඒ ගැන නම් කියන්න ඕනෙ නෑ. රුපියල් ඩොලර් අංක ගැනනම් කවුරුත් උනන්දුයි. කාලයයි, මුදලුයි කියන දේ ගැන උනන්දු අයට අනික් දේවල් අමතක වෙනවා හරියටමත්. වෙන එකක් තියා අනුන්ගේ කාලයටත් වටිනාකමක් තියෙනවාය කියන එක පවා අමතකයි. "

"ඇත්ත. තමන්ගේ කාලය විතරයි සමහරුන්ට වටින්නේ."

"වැඩකට අතගහන්න ගියාමත් අපට හරියටවත් හරස් වෙන්නේ ඔය දෙකමනේ ?" පැන් තවත් අතකට හිතුවා.

"ගාණ කීයද ? කවදා වෙනකොටද ඉවර කරන්න ඕන ? කියන ප්‍රශ්න තමයි මුලටම එන්නේ."

"ඒක සාධාරණයිනේ. අපි කතා කර කර හිටියෙත් ඒ ගැනමනේ. ඒ නිසයි ඒක ඒහෙම වෙන්නේ."

"කාලයට, මුදලට මේ තරම් වටිනාකමක් ලැබිලා තියෙන්නේ දැං මේ තරඟය නිසා." පින් තව පැත්තකට කතාව හරවනවා.

"අපේ මුතුන් මිත්තෝ ගොයිතැන් බත් කරගෙන විවේකයෙන්, සැනසිල්ලෙන් තමන්ගේ කාලය ගෙව්වා. මුදලට ගන්න බැරි බොහොම දේවල් ඒ අය ගාව තිබුණා. ගුණගරුක බව, අවංකකම, නිර්ව්‍යාජකම, සරලබව එක්ක ඒ අය දැහැමෙන් සෙමෙන් කාලය ගෙව්වනේ. නිසි කලට කරන්න ඕන කටයුතු කරලා සතුටින් හිටියා."

"ඒ සරළ බව හැමදාම තියාගන්න අමාරුයි. ලෝකය දියුණුවෙවී ඉස්සරහට යද්දී තරඟකාරීබව නිකම්ම ඇතිවෙනවා. අපිත් ඒ තරඟයට නිකම්ම වැටිලා. එයින් මිදෙන්නනම් අපි ඒ ජීවිතය ගත කරන්න ඕන."

"ආගමට දහමට කැපවෙලා බණ භා-වනාවලට යොමු වුන අය නැත්තේ නැහැ. ඒත් ඒ අනුන්ට පෙන්නන්න විතරක් වුනොත් රැවටෙන්නේ තමන්මයි."

"ගෙවුන කාලය ගැන අපට මොනවද කියන්න පුළුවන් ? සතුටු වෙන්න පුළුවන්ද තමන්ගේ අතීතය ගැන ? කියන කාරනාව තමයි වැදගත් වෙන්නේ."

"පසුගිය කාලේ තමන් අපතේ අරින්නේ නැතිව කටයුතු කළානම් තමන් දිනුම්. ඒ ඒ කාලවකවානුවල තමන්ට කරන්න පුළුවන් දේවල්, යුතුකම්, වගකීම් ඉටුකලාය කියලා හෘදය සාක්ෂියට එකගව හිතන්න පුළුවන්නම් ඒ අතීතය ගැන දුක් වෙන්න දෙයක් නෑ. එතෙන්දි රුපියල්, ඩොලර් අංකය ඒ තරම් වැදගත් වෙන්නේ නෑ. ඒ වගේම අප මහ දිග කාලයක් ජීවත් වුනාය කියලා වයසට අනුරූපව දෙන කාලයේ අංකය වැදගත් වෙන්නෙත් නෑ. වැදගත් වෙන්නේ පොඩි කාලයක් ඇතුළත හරි තමන් කළ කී යහපත් දේ විතරයි."

"ඒ විදියට සතුටු වෙන්න පුළුවන්කමක් නැත්නම් තවම අපි ප්‍රමාද නෑ. අළුත් අවුරුද්දක් ලබලයි තියෙන්නේ. ඒ අවුරුද්දේ කල්ගත කරන පිළිවෙල ගැන අළුතින් හිතන්න පුළුවන්. එහෙම හිතන අයට මේ ලකුණු 2018 අංක දරණ අවුරුද්ද සුභ අළුත් අවුරුද්දක් වේවි."

"මේ ගැන හිතලා බලන හැමෝටම සුභ අළුත් අවුරුද්දක් වේවා..! කියලා අපි ප්‍රාර්ථනා කරමු."